**15-04-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබේ මුල් ආගම සාමය වන අතර සැබෑ සාමය ඇත්තේ සාම දේශයේය. සැමට මෙසේ කියන්න: ඔබේ මුල් ආගම තුළ ස්ථාවර වන්න.

**ප්‍රශ්නය:** පරම පියාට පමණක් ඇත්තේ ඔබ මෙකල අධ්‍යයනය කරන කුමන ඥානය ද?

**පිළිතුර:** පුණ්‍යවන්ත බව සහ පාපී බව පිළිබඳ ඥානයයි. පරම පියාට අපහාස කිරීමට භාරත්වාසීන් පටන් ගත් දා සිට ඔවුන් පාපී ජීවාත්ම සත්ථාවන් බවට පත් විය. පරම පියාත් නාටකයත් පිළිබඳ දැනගත් පසු ඔවුන් පුණ්‍යවන්තයින් බවට පත් විය. ඔබ දරුවන් මෙම අධ්‍යයනය කරන්නේ මෙකල පමණි. ඔබ දන්නවා සියලු දෙනාට ගැලවීම ලබා දෙන්නා පරම පියාම බව. මනුෂ්‍යයින්ට තවත් මනුෂ්‍යයෙකුට ජීවන් මුක්තිය හෝ ගැලවීම ලබා දිය නොහැක.

**ගීතය:** මෙම පාපී ලෝකයෙන් අපව විවේකී සැපවත් තැනකට ගෙන යත්වා...

ඕම් ශාන්ති. පරම පියා මෙහි සිට ඔබට විස්තර කරන්නේ මෙය පාපීන්ගේ ලෝකය බවයි. දෙව් දේවතාවුන්ගේ රජ දහන ලෙස පුණ්‍යවන්ත ජීවාත්ම සත්තාවන්ගේ ලෝකය බවට පත් වී තිබුණේ මේ භාරතය බව කිව හැකියි. මෙම භාරතය සතුටේ දේශය විය. වෙනත් භූමි නොතිබුණි එකම භාරතයම පමණි. සත් යුගයේ දී සතුට සහ සැපය තිබුණු අතර එයට කීවේ දෙව්ලොව කියාය. මෙය අපායයි. භාරතය දෙව්ලොව වී තිබුණු අතර දැන් එය අපාය බවට පත් වී ඇත. අපාය තුළ සැපය, සාමය හෝ සතුට තිබිය හැක්කේ කෙසේද? අපාය යනු කලි යුගයයි. කලි යුගයේ අවසානය අපායේ උච්චතම අවස්ථාවයි. ඊට කියන්නේ දුක්බර ලෝකය කියාය. භාරතය ලක්ෂ්මී නාරායන රජදහන ලෙස තිබුණු කල එය සතුටේ දේශය විය භාරත්වාසීන්ගේ ගෘහස්ථ ආගම පාරිශුද්ධියයි. පාරිශුද්ධිය, සාමය හා සතුට සේම බොහෝ ධනයක් ද තිබුණි. එම භාරතයම දැන් අපවිත්‍ර වී ඇත සියල්ලම පාපී වී ඇත. මෙය දුක් දේශයයි. භාරතය සතුටේ දේශය වූ අතර ජීවාත්ම සත්තාවන් වන අපේ නිවහන සාමයේ දේශයයි. සාමය දැකිය හැක්කේ සාම දේශයේ ම පමණි. ජීවාත්ම සත්තාවන්ට සාමයෙන් සිටිය හැක්කේ එහිදී පමණි. එය මිහිරි නිවහන, අශරීරික ලෝකය නමින්ද හැඳින්වේ. එය වූ කලී ජීවාත්ම සත්තාවන්ගේ මහ ගෙදරයි. අප එහි සිටින කල සිටින්නේ සාමයෙනි. වනගත වීම ආදියෙන් සාමය සොයාගත නොහැක. සාම දේශය යනු එවන් ස්ථානයකි. සත් යුගයේ දී, සාමය සේම සතුට ද ඇත. මෙම දුක්බර ලෝකය තුළ සාමය කෙසේවත් තිබිය නොහැක. එය දැකිය හැක්කේ සාම දේශයේම පමණි. සතුටේ දේශයේ දී ද ක්‍රියාවන් කෙරේ ඔවුන් ඔවුන්ගේ චරිත කොටස් ශරීර තුළින් රඟපෑ යුතුමයි. මෙම දුක්බර ලෝකයේ සිටින එකම මනුෂ්‍යයෙකුටවත් සතුට හෝ සාමය නැත. වත්මන් ලෝකය වූ කලී ඉතා අපිරිසිඳු දූෂිත දේශයක් වන අතර ඒ නිසයි ඔවුන් පාරිශුද්ධකරුවාණන්ට අඬගා සිටින්නේ. කොහොමනමුත්, කිසිම කෙනෙක් පරම පියා නොදන්නා නිසා ඔවුන් අනාථයින් බවට පත් වී ඇත. අනාථ වීම නිසාම ඔවුන් දිගින් දිගටම ඔවුනොවුන් අතර රණ්ඩුසරුවල්ම කර ගනී. එතරම්ම දුකක්, සාමයෙන් තොර බවක් සහ ප්‍රචණ්ඩ බවක් ම ඇත! මේ රාවණ් රාජ්‍යයයි. ඔවුන් ඉල්ලා සිටින්නේ රාම රාජ්‍යයයි. රාවණ් රාජ්‍යයේ සාමය ද නැත, සතුට ද නැත. රාම රාජ්‍යයේ සතුට සහ සාමය දෙකම ඇත එහිදී ඔවුන් කිසි විටෙක ඔවුනොවුන් අතර සටන් නොකරයි. පාප පහ එහි නැත. ඒවා ඇත්තේ මෙහිය. පළමු සහ ප්‍රධාන පාපය ශරීර අවධානයයි. ඊළඟට කාම රාගය සහ තරහව. භාරතය දෙව්ලොව ලෙස තිබුණු කළ කිසිඳු පාපයක් නොතිබුණි. එහි සිටි සැවොම ජීවාත්ම සත්තා විඥානයෙන් යුතුව සිටියහ. ඉනික්බිතිව රාගය සහ තරහව ඇති විය. මෙකල සියලුම මනුෂ්‍යයින් ශාරීරික විඥානය සහිත බවට පත් වී ඇත. දෙව් දේවතාවන් ජීවාත්ම සත්තා විඥානයෙන් යුතුව සිටියහ. ශරීර විඥානයෙන් යුතුව සිටින මනුෂ්‍යයින්ට කෙසේවත් කිසි කෙනෙකුට සතුට දිය නොහැක. ඔවුන් දිගටම එකිනෙකාට දෙන්නේ දුකමයි. කෝටිපතියන්, ප්‍රකෝටිපතියන් හෝ බිලියනපතියන් සතුටින් සිටී යැයි නොසිතන්න කොහෙත්ම නැත. ඒ සියල්ල මායාගේ පම්පෝරියයි. මෙය මායාගේ රජදහනයි. මහාභාරත යුද්ධය ඔබ ඉදිරියේ ඇත්තේ විනාශය සඳහාමයි. මේ විනාශයෙන් පසු දෙව්ලොව දොරටු විවෘත වෙයි. මුල් චක්‍ර භාගයෙන් පසු අපායට ගේට්ටු විවෘත විය. මේවා අනෙකුත් ලේඛණ වල සඳහන්ව නැත. භාරතයේ මිනිසුන් මෙසේ කියයි අප භක්ති කළ විට දෙවියන් හමු වෙයි. බාබා කියන්නේ මෙසේය ඔබ භක්ති කර සම්පූර්ණයෙන්ම කඩාවැටුණු පසු, එවිට මා දෙව්ලොව ස්ථාපනය කිරීමට, භාරතය දෙව්ලොව බවට පත් කරවීමට ආ යුතුයි. දෙව්ලොව බවට පත් වී තිබුණු භාරතය අපාය බවට පත් වූයේ කෙසේද? එසේ කළේ

රාවණ්ය. ඔබට රජදහන ලැබුණේ ගීතාවේ දෙවියන්ගෙනි. ඔබ උපත් 21කට දෙව්ලොව රජදහන පාලනය කළා. ඉන්පසු භාරතය ද්වෝපූර් යුගයේ සිට කලි යුගය දක්වා පිරිහුණා. ඒ නිසයි බොහෝ දෙනෙක් මෙසේ හඬගා කියන්නේ පාරිශුද්ධකරුවාණනි, පැමිණෙන්න! අපිරිසිදු මිනිසුන්ට මෙම අපිරිසිදු ලෝකයේ සාමය හෝ සතුට ලැබිය නොහැකියි ඔවුන් දිගටම බොහෝ දුක් ලබයි. අද, ඔවුන්ගේ මුදල් සොරකම් කෙරේ. අද, ඔවුන් බංකොලොත්භාවයට පත් වේ. අද, ඔවුන් ලෙඩ වේ. ඇත්තේ වෙන කිසිවක් නොව දුකම පමණි. ඔබ දැන් උත්සාහ ගන්නේ සාමයේ හා සතුටේ ඔබගේ උරුමය ලබාගන්නයි. ඔබ පරම පියාගෙන් ඔබගේ දෙව්ලොව උරුමය ලබා ගැනීමට උත්සාහ කරයි. පරම පියා පමණි ඔබට නිරතුරු සතුට දෙන්නේ. නිරතුරු අසතුට ඇති කරවන්නේ රාවණ්ය. භාරතයේ මිනිසුන් මේවා නොදනී. සත් යුගයේ දී දුක පිළිබඳ කිසිවක් නැත. ඔබට එහිදී අඬන්නට සිදු නොවේ. ඇත්තේ සැමවිට සතුට සහ වෙන කිසිවක් නොව සතුටමයි. එහි ශාරීරික අවධානය, කාමරාගය හෝ තරහව ආදිය නැත. පාප පහ අත් හැර දමන තුරු අසතුට නම් වූ අපලය දුරු කළ නොහැකියි. මෙසේ කියමනක් ඇත දානයක් දී අපල දුරු කර ගන්න. මෙකල මේ භාරතය පුරා ඇත්තේ රාහුගේ බලයයි. පාප හැර දමන තුරු ඔබට කලා 16කින් සම්පූර්ණ දෙවි දේවතාවුන් බවට පත්විය නොහැකිය. සැමට ගැලවීම ලබා දෙන්නා පරම පියාය. මිනිසුන් මෙසේ කියයි ගුරු නොමැතිව ගැලවීම නොලැබේ. කොහොමනමුත්, ඔවුන් ගැලවීම යන්නෙහි තේරුම ද නොදනී. 'මනුෂ්‍යයාගේ විමුක්තිය හා ගැලවීම' යනු විමුක්තිය සහ ජීවන් මුක්තියයි. මේවා දිය හැක්කේ පරම පියාට පමණි. හැම කෙනෙකුටම යම් ගැලවීමක් දැන් ඇත. දිල්ලි නගරයත් නව දිල්ලිය සහ පැරණි දිල්ලිය කියා දෙකකි. කොහොමනමුත්, දැන් නම් එහි නවතාවයක් නැත. නව දිල්ලිය ඇත්තේ නව ලෝකයේය. පැරණි ලෝකයේ ඇත්තේ පැරණි දිල්ලියයි. ඇත්තෙන්ම යමුනා ගංතෙර තිබුණු අතර එහි දිල්ලිය සුර දූතයින්ගේ දේශය විය. එය දෙවි දේවතාවුන් පාලනය කළ සත් යුගයයි. පැරණි ලෝකයේ ඇත්තේ පැරණි දිල්ලියයි. නව ලෝකයේ තිබුණේ ලක්ෂ්මී නාරායන රාජධානියයි. භාරත්වාසීන් මෙය අමතක කර ඇත. නව භාරතය සහ නව ලෝකය තිබුණු අතර එය ඔවුන්ගේ රජදහන විය. එකල වෙනත් දේශ නොතිබුණි. මේවා කිසි කෙනෙක් නොදනී. රජයන් මේවා උගන්වන්නේ ද නැත. ඔවුන් දන්නේ අසම්පූර්ණ ඉතිහාසයයි. එය ඉස්ලාම්වරු සහ බෞද්ධයින් පැමිණියාට පසු සිදු වූ දෙයයි. ලක්ෂ්මී නාරායන රාජධානිය ගැන කිසිවෙක් නොදනී. මුළු ලෝක චක්‍රය කැරකෙන ආකාරය පරම පියා පමණක් මෙහි සිට විස්තර කරයි. භාරතය දෙව්ලොව වූ විට ඒ සත් යුගයයි. දැන්, බලන්න එම භාරතයට සිදු වී ඇති දේ! ඉතින් භාරතය දියමන්තියක් බවට නැවත පත් කළ හැක්කේ කාටද? පරම පියා මෙසේ කියයි ඔබ ජීවාත්ම සත්තාවන් සැවොම සම්පූර්ණයෙන් පාපකාරී වූ පසු මා පැමිණ පුණ්‍යවන්තයින් බවට පත් කරවමි. කිසිවෙක් නොදන්නා මෙම නාටකය පූර්ව නියමිත වූවකි. මෙම ඥානය පරම පියාට මිස වෙන කිසිවෙකුට දිය නොහැක. පරම පියා පමණි ඥානයෙන් පිරී ඇත්තේ. ඔහු පැමිණ ඔබට උගන්වයි. මනුෂ්‍යයින්ට තවත් මනුෂ්‍යයකු කිසිදා ගලවා ගත නොහැක. ඔබ දෙවි දේවතාවුන් ව සිටි කල, ඔබ එකිනෙකාට ලබා දුන්නේ සතුට පමණි. එහි කිසිවෙක් ලෙඩ වන්නේ නැත. මෙහි හැම කෙනෙක්ම ලෙඩෙකි. එය නැවත දෙව්ලොව බවට පත් කරවීමට පරම පියා පැමිණ ඇත. පරම පියා දෙව්ලොව තනන අතර රාවණ් අපාය තනයි. මේ කිසිවෙක් නොදන්නා නාටකයයි. ලේඛණ වල ඇති දැනුම දර්ශනයක් පමණයි භක්ති මාර්ගයයි. එය ගැලවීමේ මාර්ගය නොවේ. මෙය ලේඛණ වල තිබෙන දර්ශනය නොවේ. පරම පියා ලේඛණ පිළිබඳ කතා නොකරයි. මෙය වූ කලී ආධ්‍යාත්මික ඥානයයි. පරම පියාට කියන්නේම ආධ්‍යාත්මික පියා කියාය. ඔහු ජීවාත්ම සත්තා සැමගේ පියාය. පරම පියා මෙසේ කියයි මා මානව ලෝකයේ බීජය වන අතර මා දැනුමෙන් පිරී ඇති බව කියන්නේ ඒ නිසාය. මා දන්නවා මිනිස් ලෝක ගසට කොපමණ ආයුෂ ඇත්ද, එය වර්ධනය වන්නේ කෙසේද සහ භක්ති මාර්ගය ආරම්භ වන්නේ කෙසේද කියා. මා ඔබ දරුවන්ට මෙම ඥානය ලබා දී ඔබට ලෝකය අයිති කර දී එහි හිමිකරුවන් බවට ඔබව පත් කරවමි. ඔබ මේ ඥානය ලබන්නේ එක වතාවක් වන අතර ඉන්පසු එය අතුරුදන් වේ. මෙම ඥානය සත් යුගයේ සහ ත්‍රේත යුගයේ අනවශ්‍යය. මෙම ඥානය ඇත්තේ ඔබ බ්‍රහ්මිණ්රුන්ට පමණි. දෙවි දේවතාවුන්ටද මෙම ඥානය නැත. ඒ අනුව මෙම ඥානය අනාදිමත් කාලයක සිට ආ නොහැකියි. ඔබ දරුවන් මෙම ඥානය එකවරක් ලැබීම තුළින් ජීවන්මුක්තිය ලබයි. ඔබට උරුමය ලැබෙන්නේ පරම පියාගෙනි. බොහෝ අය ඔබ වෙත පැමිණ චිත්ත සාමය ලැබෙන්නේ කෙසේදැයි අසයි. කොහොමනමුත්, එසේ ඇසීමද වැරදිය. ශරීරයකට අවයව තිබෙනවා සේ, මනස සහ බුද්ධිය ජීවාත්මයේ ඉන්ද්‍රියන්ය. පරම පියා පැමිණ පමණි ජීවාත්ම සත්තාවන්ගේ ගල් බුද්ධිය දිව්‍යමය බුද්ධිය බවට වෙනස් කරන්නේ. එය සත් යුගය සහ ත්‍රේත යුගය තෙක් පවතී. ඉන්පසු ඔවුන්ගේ බුද්ධිය ගල් වේ. දැන්, ඔබ ගල් බුද්ධිය ඇති අයව සිට නැවත වරක් දිව්‍යමය බුද්ධිය ඇති අය බවට පත් වේ. ඔබේ දිව්‍යමය වී තිබුණු බුද්ධියට වෙනත් දෑ මිශ්‍ර විය. දැන් ඔබේ බුද්ධිය නැවත දිව්‍යමය බවට පත් වන්නේ කෙසේද? පරම පියා

මෙසේ කියයි ජීවාත්ම සත්තාවනි, මා පමණක්ම සිහිකරන්න! ඒ වන්දනා ගමනේ සිටීමෙන් ඔබ පිරිසිදු වී මා වෙත එනු ඇත. චිත්ත සාමය ඇති කරගන්නේ කෙසේ ද යන්න අසන අයට ඔබ මෙසේ කියන්න මෙහිදී සාමය ඇතිවන්නේ කෙසේද? මෙහි පාප ඇති නිසා මේ දුක් ලෝකයයි. අසීමිත පරම පියාගෙන් පමණි ඔබට උරුමයක් ලැබෙන්නේ. රාවණ් ඇසුරින් ඔබ අපිරිසිදු වන අතර පරම පියා තුළින් තත්පරයක ඇසිල්ලෙන් පිරිසිදු බවට පත් වෙයි. ඔබ දැන් පැමිණ ඇත්තේ පරම පියාගෙන් ජීවන්මුක්ති උරුමය ලබාගැනීමටයි. පරම පියා ඔබට ජීවන්මුක්ති උරුමය දෙන අතර ඉන් පසුකලෙක රාවණ්ගේ සාපයෙන් ඔබ බන්ධන ජීවිතයට වැටේ. එම නිසයි මෙහි වෙන කිසිවක් නොව දුකම ඇත්තේ. නාටකය දත යුතුය. කිසිවෙකුට දුක් ලෝකයේ දී සාමය සතුට ලැබිය නොහැක. අප ජීවාත්ම සත්තාවන්ගේ මුල් ආගම සාමය වන අතර සාම දේශය අප සැම ජීවාත්ම සත්තාවන්ගේ මහ ගෙදරයි. ජීවාත්ම සත්තාව මෙසේ කියයි මගේ මුල් ආගම සාමයයි. එහි දී මම මෙම ශරීර හාමෝනියම් භාණ්ඩය වැයීම නොකොට, තැන්පත්ව සිටිමි. කොපමණ කල් මා එසේ සිටින්නද? ක්‍රියාවන් සිදු කළ යුතුව ඇත. මිනිසා නාටකය හරි හැටි තේරුම් ගන්නා තුරු ඔවුන්ට අසතුට තිබේ. පරම පියා මෙසේ කියයි මා දුප්පතුන්ගේ ස්වාමියාය. දුප්පතුන් පමණක් මෙහි පැමිණේවි. ධනවතුන්ට, දැන් මෙය දෙව්ලොව නේ ඔවුන්ට දෙව්ලොව සතුට ඔවුන්ගේ වාසනාවේ නැත. පරම පියා මෙසේ කියයි මා දුප්පතුන්ගේ ස්වාමියාය. මා ධනවතුන් දුප්පතුන් කරවන අතර දුප්පතුන් ධනවතුන් කරයි. ධනවතුන්ට ඔවුන්ගේ ධනය ගැන ඇති කුල්මත් බව නිසා එතරම් ඉහළ තත්ත්වයක් ලැබිය නොහැකිය. ඔව්, ඔවුන්ට යටත් වැසියන් බවට පත් වීමේ හැකියාව ඇත. ඔවුන්ට නියතයෙන්ම දෙව්ලොව යා හැකිය, නමුත් ඉහළ තත්ත්වයක් ලබන්නේ දුප්පතුන්ය. දුප්පතුන් ධනවතුන් බවට පත් වේ. එම මිනිසුන්ට තම ධනය ගැන අහංකාරය ඇති නමුත් බාබා මෙසේ කියයි ඔවුන්ගේ සියලු ධනය හා දේපළ අළු දූවිලි බවට පත් වේ. විනාශය සිදුවනු ඇත. ජීවාත්ම සත්තා විඥානයට පත් වීමට ඔබ උත්සාහ කළ යුතුයි. මෙකල හැම කෙනෙක්ම සිටින්නේ ශරීර අවධානයෙනි. දැන් ඔබ ජීවාත්ම සත්තා විඥානයට පත් විය යුතුයි. ජීවාත්ම සත්තාව මෙසේ කියයි මා උපත් 84ක් සම්පූර්ණ කළා. නාටකය අවසාන වෙමින් තිබෙන අතර අප ආපසු ගෙදර යා යුතුයි. දැන් මේ ඇත්තේ කලි යුගයේ අවසානයත් සත් යුගයේ ඇරඹුමත් අතර වන සංගම් යුගයයි. පරම පියා මෙසේ කියයි මම හැම අවුරුදු 5000කින්ම පැමිණ භාරතය නැවතත් දියමන්තියක් කරවමි. මෙම ඉතිහාසය හා භූගෝලය ඔබට කියා දිය හැක්කේ පරම පියාට පමණි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පරම පියාගෙන් ජීවන් මුක්ති උරුමය ලබා ගැනීම සඳහා නියතයෙන්ම පාරිශුද්ධ වන්න. දුක් දේශයේ ජීවත්ව සිටින ගමන් බුද්ධිය තුළ නාටකය පිළිබඳ ඥානය තබාගෙන දුක් අභිබවා සිටින්න.
2. ධනය සහ දේපළ පිළිබඳ කුල්මත්භාවය අතහැර ජීවාත්ම සත්ථා විඥානය තුළ සිටීමට උත්සාහවන්ත වන්න.

**වරදානය:** ඔබ සම්පූර්ණයෙන්ම කැපවූ භාරකරුවෙකු වී, පාප පරම්පරාවේ සැම අංශුමාත්‍රයක්ම අවසන් කරත්වා.

ඔබ ඔබේ පැරණි සංස්කාර වල දේපළ යම් කාලයකට පසෙකට දැමූ විට, මායා කුමන හෝ ආකාරයකින් ඔබව අල්ලා ගනී. ඔබේ පැරණි චාර්ථා සටහනේ කුඩා කැබැල්ලකින් පවා ඔබව අල්ලා ගත හැකිය. මායා ඉතා තියුණු ය, ඇගේ අල්ලා ගැනීමේ බලය අඩු නොවේ. එබැවින්, දැන් පාප පරම්පරාවේ ඕනෑම අංශුමාත්‍රයක් පවා අවසන් කරන්න. ඔබේ පැරණි වස්තුන්වල කිසිදු සලකුණක් කිසිදු කොනක නොතිබිය යුතුය. මෙසේ සම්පූර්ණයෙන්ම කැප වූ භාරකරුවෙකු වීම යනු යගියාව සමඟ සෙනහසින් හා සහයෝගයෙන් කටයුතු කිරීමයි.

**පාඨය:** ඔහුගේ හෝ ඇයගේ විශේෂත්වය නිසා යමෙකු කෙරෙහි විශේෂ සෙනෙහසක් තිබීම ද බැඳීමකි.

***** ඔම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරි බව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

මිහිරි බව ශ්‍රේෂ්ඨත්වය වන අතර, මෙම මිහිරි බව තිබීමෙන්, කෙනෙකුගේ මනසෙහි සහ වචන වල ඇති ඕනෑම තිත්ත බවක් අවසන් වන අතර කෝපයේ ගින්න සිසිල් වේ. බාප්දාදාට අවශ්‍ය වන්නේ සියලුම දරුවන් සිසිල් දේවතාවන් බවට පත් කරවීමටයි. එබැවින්, මිහිරි බවේ ගුණය ධාරණය කර ගන්න. ඔබේ මුහුණත් මිහිරි විය යුතුයි. මිහිරි බවේ ගුණයෙන් පිරිපුන් වන්න. ඔබ ඉදිරියට එන ඕනෑම කෙනෙකුව ඔබේ මිහිරි වචන වලින් සහ බලවත් දෘෂ්ටියෙන් පුරවන්න.